අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/21/08/04/2022
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022/10/31

**චක්‍රලේඛ අංක : 35/2022**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පරිවේණාධිපතිවරුන්,
සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,
සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්,
සියලුම උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන්,
සියලුම ජාත්‍යන්තර පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**'සුරක්ෂා' සිසු රක්ෂණාවරණය**

2021.12.02 දින සිට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන අතර, ඒ අනුව 'සුරක්ෂා' සිසු රක්ෂණාවරණයට අදාළ ව නිකුත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 04/2021 දරන චක්‍රලේඛය එදින සිට අවලංගු කෙරේ.

02. 2017 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව රජය විසින් දරුවන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස හඳුන්වා දුන් 'සුරක්ෂා' සිසු රක්ෂණාවරණය වැඩසටහන 'සදා සුරකිමු- දැයේ දරුවන්' තේමාව යටතේ තවදුරටත් ක්‍රියාත්මක වේ.

03. දැනුමින් හා කුසලතාවලින් පරිපූර්ණ වූ දරුවන් සමාජ ගත කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ මූඛ්‍ය පරමාර්ථය වන අතර සෑම වයස් කාණ්ඩයක දීම ඒ සඳහා ආරක්ෂිත පරිසරයක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින් කායික හා මනෝ සමාජීය යහපැවැත්ම තහවුරු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විවිධ පියවර ගෙන ඇති අතර පාසල තුළ දී හා ඉන් පිටත දී ඇති වන රෝග, අනතුරු හා ආබාධ සඳහා ආරක්ෂාව තහවුරු කිරීමේ පියවරක් ලෙස මෙම සෞඛ්‍ය රක්ෂණාවරණය ක්‍රියාත්මක වේ.

04. රෝග, අනතුරු හා ආබාධ තත්ත්වවල දී ඉක්මන් සෞඛ්‍ය සේවා සඳහා යොමු කරමින් ඉක්මන් සුවය තුළින් පාසල් පැමිණීම වැඩි කිරීම, ආබාධ තත්ත්වවල දී අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු වීමට සහාය වීම යන අරමුණු මත 'සුරක්ෂා' සිසු රක්ෂණාවරණය හඳුන්වා දී ඇති අතර, එ මඟින් සියලු ම ශ්‍රී ලාංකික පුරවැසි පාසල් හා පිරිවෙන් සිසුන් ආවරණය කෙරේ. එනම් සියලුම රජයේ පාසල්, ආධාර ලබන හෝ නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන් සහ ජාත්‍යන්තර පාසල්හි ඉගෙනුම ලබන 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල වයස අවුරුදු 5ත් 21ත් අතර සිසුන් ද, උපකෘත විශේෂ පාසල්වල හා පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවල ඉගෙනුම ලබන වයස අවුරුදු 4 ත් 21 ත් අතර වයස් සීමාවේ පසු වන සිසුන් ද ඇතුළු සියලුම ශ්‍රී ලාංකික පුරවැසි සිසුහු ප්‍රතිලාභීහු වෙති.

05. 2021 දෙසැම්බර් 02 දින සිට 2022 දෙසැම්බර් 01 දක්වා කාලය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ගිවිසුම් ගත වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ගිවිසුම් ගත වූ කාලය තුළ දිනයේ පැය 24 ම, වර්ෂයේ සියලුම දින ආවරණය වන පරිදි මෙම රක්ෂණාවරණය සපයනු ලැබේ.

රක්ෂණාවරණ පහසුකම් පහතින් දැක්වේ.

i. සෞඛ්‍ය රක්ෂණාවරණ
- නේවාසික ප්‍රතිකාර ප්‍රතිලාභ - රු 200,000 /= (රජයේ/පුද්ගලික)
- බාහිර ප්‍රතිකාර ප්‍රතිලාභ - රු. 10,000 /= (උපදෙස් සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ සඳහන් ප්‍රතිලාභ)
- අසාධ්‍ය රෝග ප්‍රතිලාභ - රු. 200,000/= සිට රු.1,500,000/= දක්වා

ii. අනතුරු රක්ෂණාවරණ
- පූර්ණ සදාකාලික අකර්මණ්‍යතා සඳහා - රු.200,000/=
- සදාකාලික අර්ධ අකර්මණ්‍යතා සඳහා - රු.150,000/= - රු. 200,000/= දක්වා
- තාවකාලික අකර්මණ්‍යතා සඳහා - රු. 25,000 /= සිට රු.100,000/= දක්වා

iii. ජීවිත රක්ෂණාවරණ

අඩු අදායම්ලාභී පවුල්වල සිසුන්ගේ මාපිය/නීත්‍යානුකූල භාරකරු වියෝවක දී සිසු දරුවකු සඳහා රු. 75,000 /= බැගින් හිමිවේ. එක් මරණයක් වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම මුදල රු.225,000/= වන අතර පවුලේ සියලුම සිසුන් අතර එම මුදල සමාන ව වෙන් කෙරේ. මාපියන් දෙදෙනාගේම මරණ සඳහා වෙන් වෙන් වශයෙන් මෙම රක්ෂණාවරණය හිමි වේ.

06. ඉහත ප්‍රතිලාභ ලබා ගැනීමට 'සුරක්ෂා' සිසු රක්ෂණාවරණය තහවුරු කිරීම සඳහා හිමිකම් ඉල්ලුම් පත්‍රයේ (ඇමුණුම 01) විදුහල්පති විසින් අත්සන තබා සහතික කිරීම අනිවාර්යය වේ.

07. මෙම රක්ෂණාවරණ පිළිබඳ සියලු විස්තර හා එක් එක් අධ්‍යාපන ආයතන සතු කාර්යභාරය උපදෙස් මාලාව තුළ අන්තර්ගත කෙරේ.

08. අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් හඳුන්වා දෙන 'සුරක්ෂා' සිසු රක්ෂණාවරණයට අදාළ ප්‍රතිලාභ, කොන්දේසි හා අපේක්ෂිත කාර්යභාරය පිළිබඳ නිසි පරිදි ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපන බලධාරීන් කටයුතු කළ යුතු ය.

09. නිරෝගී දරු පරපුරක් දැයට දායාද කිරීම හා අධ්‍යාපනික අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ඉඩකඩ සැලසීම සඳහා සිසු රක්ෂණාවරණයේ ප්‍රතිලාභ සිසුන්ට හිමිකර දීමට අදාළ සියලුම පාර්ශ්ව විසින් උපරිම දායකත්වයෙන් යුතුව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

එම්. එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත් -**
1. ජනාධිපති ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
3. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සඳහා
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා
5. ලේකම් - සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා
6. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම සඳහා

# උපදෙස් මාලාව

## 1 වන පරිච්ඡේදය - සුරක්ෂා සිසු රක්ෂණාවරණය

රක්ෂණාවරණය, රක්ෂණ ආයතනය, ප්‍රතිලාභීන්, ප්‍රතිලාභියකු බවට පත් වීම පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

### 1.1. රක්ෂණාවරණය

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙනු ලබන රක්ෂණාවරණය 'සුරක්ෂා' සිසු රක්ෂණාවරණය ලෙස හැඳින්වේ. 2021 දෙසැම්බර් 02 දින සිට 2022 දෙසැම්බර් 01 වෙනි දින දක්වා කාලය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ගිවිසුම් ගත වූ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මෙම 'සුරක්ෂා' රක්ෂණාවරණය සැපයේ.

### 1.2. ප්‍රතිලාභීන්

සියලු ම රජයේ පාසල්, ආධාර ලබන හෝ නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන්, ජාත්‍යන්තර පාසල් යන විධිමත් සාමාන්‍ය අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වී අධ්‍යාපන කාර්යයේ නිරත වන 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල වයස අවුරුදු 5ත් 21ත් අතර සිසුන් ද, උපකෘත විශේෂ පාසල්වල හා පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවල ඉගෙනුම ලබන වයස අවුරුදු 4ත් 21ත් අතර වයස් සීමාවේ පසු වන සිසුහු ඇතුළු සියලුම ශ්‍රී ලාංකික පුරවැසි සිසුහු ප්‍රතිලාභීහු වෙති. පාසලෙන් ඉවත් වන සිසුන් ප්‍රතිලාභීන් ලෙස සලකනු නොලැබේ.

මෙම චක්‍රලේඛයේ සහ උපදෙස් සංග්‍රහයයෙහි රජයේ පාසල්, ආධාර ලබන හෝ නොලබන පෞද්ගලික පාසල්, උපකෘත විශේෂ පාසල්, ජාත්‍යන්තර පාසල් හා පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක **'පාසල්'** යන්නෙන් අරුත් ගැන්වෙන අතර මූලික පිරිවෙන්, මහ පිරිවෙන් සහ විද්‍යායතන **'පිරිවෙන්'**යන්නෙන් අරුත් ගැන්වේ. ගිහි-පැවිදි ශිෂ්‍ය- ශිෂ්‍යාවන් **'සිසුන්'** යන්නෙන් අරුත් ගැන්වේ.

## 2 වන පරිච්ඡේදය - රක්ෂණාවරණ අවස්ථා හා ප්‍රතිලාභ

සෞඛ්‍ය ප්‍රතිලාභ, අනතුරු ප්‍රතිලාභ, මියයාමක දී හිමිවන ප්‍රතිලාභ, විශේෂ ප්‍රතිලාභ අවස්ථා හා මූල්‍ය ප්‍රමාණ පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදයෙහි විස්තර කෙරේ.

### 2.1 සෞඛ්‍ය ප්‍රතිලාභ (වියදම් ප්‍රතිපූරණය කිරීම පමණි)

#### 2.1.1 නේවාසික ප්‍රතිකාර ප්‍රතිලාභ – රු. 200,000/=

සියලුම හිමිකම් වර්ෂයට අදාළ හිමිකම් මුදල් ප්‍රමාණයන්ට යටත්ව ගෙවනු ලැබේ.

(රජයේ රෝහලක ගෙවීම් වාට්ටුවක, හා රජයේ අනුමත පුද්ගලික රෝහල් සඳහා)

- නේවාසික ප්‍රතිකාර සහ ඖෂධ වියදම ( රජයේ රෝහලක ගෙවීම් වාට්ටුවක, පුද්ගලික රෝහලක, පුද්ගලික ආයුර්වේද රෝහලක - දිනකට උපරිම කාමර ගාස්තුව රු.12,500/-)
- වෛද්‍ය ගාස්තු/ විශේෂඥ වෛද්‍ය ගාස්තු/ ශල්‍ය වෛද්‍ය හා නිර්වින්දන වෛද්‍ය ගාස්තු
- ශල්‍ය කර්ම වියදම්, වෛද්‍ය පරීක්ෂණ, ඖෂධ සහ බෙහෙත්, සැත්කම් ගාස්තු පරීක්ෂණ, විශේෂඥ වෛද්‍යවරුන් විසින් නිර්දේශ කරන විශේෂ ප්‍රතිකාර

**රජයේ රෝහල් හා නොගෙවන වාට්ටු සඳහා**

- රජයේ රෝහලක / රජයේ ආයුර්වේද රෝහලක නොගෙවන වාට්ටුවක (Non Paying Word ) එක් රාත්‍රියක් සඳහා රු.1000/= දෛනික දීමනාව රෝහල් ගතවීමකින් තොරව සිදු කරන ශල්‍ය කර්ම සඳහා වන වියදම් ( ලැයිස්තුව අමුණා ඇත.)
- ආසාධ්‍ය හෝ බරපතළ රෝග සඳහා නිර්දේශිත විශේෂ පෝෂණ අතිරේක සඳහා වන වියදම් රෝහලින් නිදහස්වූ පසු ඖෂධ සඳහා සතියක කාලයක් වෙනුවෙන් (නිදහස් වූ දිනයේ සිට) ගෙවනු ලැබේ.

**අඩු අදායම්ලාභීන්ට පමණක් පහත අයිතම සඳහා වන ප්‍රතිලාභ ද හිමිවේ.**

- වෛද්‍ය නිර්දේශ මත විදේශයකදී සිදු කරන ප්‍රතිකාර
- දිගුකාලීන රෝග/ශල්‍ය කර්ම/අනතුරුවලදී භාවිත කිරීමට සිදුවන උපකරණ සහ ද්‍රව්‍ය සඳහා වන වියදම (TED/ stockings/ air mattress/ water mattress/ rehabilitation accessories/ special shoes/ walking aids/ crutches etc.)
- හදිසි අනතුරකින් පසු හෝ හදිසි අනතුරකින් ඇතිවන කැළැල් මත සිදු කරන ප්ලාස්ටික් සැත්කම් සඳහා යන වියදම

## 2.1.2 බාහිර ප්‍රතිකාර - රු. 10,000/=

**ප්‍රතිපූරණය කිරීම පමණි**

- රෝහල් ගතවීමකින් තොරව වුව ද පහත පරීක්ෂණ සඳහා වියදම් ප්‍රතිපූරණය කෙරේ. (EEG, MRI, CT Scan, DMSA Scan, DTPA Scan, Ultra Sound Scan)
- දන්තාබාධ සඳහා ප්‍රතිකාර - දත් ගැලවීම හා පිරවීම පමණි.
- හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන රෝග තත්ත්ව සඳහා ආයුර්වේද ප්‍රතිකාර ලබා ගැනීම (රජයේ අනුමත ආයුර්වේද වෛද්‍යශාලා )

පහත ප්‍රතිලාභ ලබා ගත හැකි වන්නේ වෛද්‍ය නිලධාරිවරයෙකු හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ අක්ෂි ශල්‍ය වෛද්‍ය වරයෙකුගේ නිර්දේශය මත පමණි ( මෙය ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ලබා ගත හැකි ප්‍රතිලාභයකි. ඒසේ වුව ද අඩු ආදායම්ලාභීන් සඳහා මෙම පහසුකම සෘජු ගෙවීමේ ක්‍රමය යටතේ ලබා ගත හැකි ය)

- අක්ෂි,කර්ණ, ශ්‍රවණ ආබාධ සඳහා ප්‍රතිකාර
- අක්ෂි, කර්ණ හා ශ්‍රවණ ආබාධ සඳහා නිවැරදි කිරීමේ උපකරණ ලබා ගැනීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශය හෝ අක්ෂි ශල්‍ය වෛද්‍ය අනුමැතිය අවශ්‍ය වේ. (උදා - ඇස් කණ්නාඩි ලබා ගැනීම, ශ්‍රවණ උපකරණ ලබා ගැනීම)

## 2.1.3 අසාධ්‍ය රෝග ආවරණය - රු. 1,500,000/= දක්වා

දේශීය රෝහලකින් ප්‍රතිකාර සිදු කර ගනු ලබන විට බිල්පත් ප්‍රතිපූරණය කිරීම හෝ සෘජු ගෙවීම් සිදු කරනු ලබන අතර විදේශ රෝහල් ප්‍රතිකාරවල දී ප්‍රතිපූරණය පමණක් සිදු කෙරේ. ප්‍රතිකාර සඳහා විදේශගත විය හැක්කේ ශ්‍රී ලංකාව තුළ අදාළ ප්‍රතිකාර නොමැතිවීම සහ කඩිනම් ප්‍රතිකාර අවශ්‍ය නමුත් පොරොත්තු ලේඛනවල රැඳී සිටීමට සිදුවන අවස්ථාවල දී පමණි. (අසාධ්‍ය රෝග සඳහා සෘජු ගෙවීම් ලබා ගත හැකි අනුමත රෝහල් ලේඛනය ඇමුණුම 05 මඟින් දක්වා ඇත.)

**අසාධ්‍ය/බරපතළ රෝග ආවරණ අවස්ථා පහත දැක්වේ.**

- හදවත් සැත්කම්(heart surgery)
- පිළිකා ප්‍රතිකාර (cancer treatments)
- වකුගඩු බද්ධ කිරීමේ සැත්කම(kidney transplantation)
- රුධිර කාන්දුකරණය (dialysis)
- උකුල්, උරහිස් හා දණහිස් අස්ථි ප්‍රතිස්ථාපනය (hip, shoulder, knee replacements)
- මොළයේ සැත්කම්(brain surgery)
- කොඳුඇට පෙළ විකෘතිවීම නිවැරදි කිරීමේ සැත්කම (scoliosis)
- කර්ණශංඛ බද්ධ කිරීමේ සැත්කම් (cochlear implantation)
- කොඳු ඇට පෙළ තෙරපුම සඳහා වූ සැත්කම (spinal cord compression)
- අක්මාව බද්ධ කිරීමේ සැත්කම් (liver transplantation)

- අක්ෂි සැත්කම් (eye surgery) (හදිසි අනතුරු හේතුවෙන් සැත්කම්, කනීනිකා සැත්කම්, අක්ෂි කාච බද්ධ කිරීම)
- කෘත්‍රිම අත්/ පාද උපකරණ මිලදී ගැනීම (artificial limbs)
- ඇටමිදුලු බද්ධ කිරීමේ සැත්කම් (bone marrow transplantation)
- තැලසීමියා (thalassemia)

## 2.2 **හදිසි අනතුරු ප්‍රතිලාභ** - ප්‍රතිපූරණය කිරීම යටතේ ( Re-Imbursment Basis)

**පූර්ණ හා සදාකාලික අකර්මණ්‍යතා ප්‍රතිලාභය -** (එක් අවස්ථාවක හෝ එක් වර්ෂයක් සඳහා උපරිම මුදල)

2.2.1 පූර්ණ සදාකාලික අකර්මණ්‍යතා සඳහා - රු. 200,000/=

- ඇස් දෙකෙහිම පෙනීම අහිමි වීම රු. 200,000/=
- කන් දෙකෙහිම ඇසීම අහිමි වීම රු. 200,000/=
- ගාත්‍රා දෙකක් අහිමි වීම රු. 200,000/=
- එක් ඇසක හා එක් ගාත්‍රයක් අහිමි වීම රු. 200,000/=
- එක් කනක් හා එක් ගාත්‍රයක් අහිමි වීම රු. 200,000/=
- එක් ඇසක හා එක් කනක් අහිමි වීම රු. 200,000/=

2.2.2 සදාකාලික අර්ධ අකර්මණ්‍යතා සඳහා - රු.150,000/= සිට රු. 200,000/=

- එක් ඇසක අහිමි වීම රු. 150,000/=
- එක් ගාත්‍රායක් අහිමි වීම රු.150,000/=
- එක් කණක් අහිමි වීම රු.150,000/=

2.2.3 තාවකාලික අකර්මණ්‍යතාව සඳහා - රු. 25,000/= සිට රු. 100,000/=

නිවසේ රැඳී සිටිමින් ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන කාලය අනුව ගෙවීම් තීරණය වේ. මෙයට අදාළ රජයේ වෛද්‍යවරයාගේ (ආයුර්වේද ප්‍රතිකාර ද අයත් වේ) නිර්දේශය සහිත ව රක්ෂණ ආයතනය විසින් ඉල්ලුම් කරනු ලබන ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය. ප්‍රතිකාර ලබන කාලය,

- සති දෙකේ සිට මාස 01 දක්වා රු. 25,000/=
- මාස 01 සිට මාස 02 දක්වා රු. 50,000/=
- මාස 02කට වැඩි රු. 100,000/=

## **2.3** මියයාම

මෙම ප්‍රතිලාභය අඩු ආදායම් සහිත පවුල්වල සිසුන් සඳහා පමණක් හිමිවේ. ඒ අනුව, පවුලේ වාර්ෂික ආදායම රු 180,000/= නොඉක්මවන බව, ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ **ග්‍රාම නිලධාරී සහතිකය** ඉදිරිපත් කළ යුතු ය.

2.3.1 මාපිය/ නීත්‍යානුකූල භාරකරු වියෝවක දී එක් ශිෂ්‍යයකු සඳහා රු. 75,000 /=

අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ගේ මාපිය/ නීත්‍යානුකූල භාරකරු වියෝවක දී සිසු දරුවකු සඳහා රු. 75,000 /= බැගින් හිමිවේ. එක් මරණයක් වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම මුදල රු.225,000/= වන අතර පවුලේ සියලුම සිසුන් අතර එම මුදල සමානව වෙන් කෙරේ. මාපියන් දෙදෙනාගේම මරණ සඳහා වෙන් වෙන් වශයෙන් මෙම රක්ෂණාවරණය හිමි වේ.

මාපිය/භාරකරු වියෝවක දී ගෙවීම් සිදු කරන්නේ ශිෂ්‍යයා වෙත පමණි. භාරකරුවන් යටතේ සිටින දරුවකු සඳහා ගෙවීම් කරන්නේ භාරකාරීත්වය අධිකරණය මඟින් පවරා තිබේ නම් පමණි.

- ශිෂ්‍යයකුගේ මරණය සඳහා ගෙවීම් සිදු නොකෙරේ.

## 3 වන පරිච්ඡේදය - ප්‍රතිලාභ ලබා ගැනීම

ප්‍රතිලාභ අහිමි වීම, ආවරණය නොවන වියදම්, ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන, රක්ෂණාවරණ ක්‍රියාවලිය තුළින් ප්‍රතිලාභ නොලබන අවස්ථා, බිල්පත් ප්‍රතිපූරණය කිරීම කළ යුතු ආකාරය මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

### 3.1 ප්‍රතිලාභ අහිමි වීම -

රජයේ නීති රෙගුලාසි අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී නොමැති රෝහලක හෝ ආරෝග්‍යශාලාවක ප්‍රතිකාර ලබන අය සඳහා මෙම ප්‍රතිලාභය හිමි නොවේ.

### 3.2 ආවරණය නොවන වියදම්

පහත වියදම් ආවරණය නොවන බව විශේෂ අවධානයට ගත යුතු යි.

- ගුවන් ටිකට්පත් (විදේශ ගතවී ප්‍රතිකාර ලබන අවස්ථාවල දී )
- ගුවනේ දී සිදුවන හදිසි අනතුරු
- සම්භාහන සඳහා යන වියදම් (spa)
- හදිසි අනතුරක දී නොවන අවස්ථාවක සිදුකරන සුන්නත් කිරීම ( circumcsion) සඳහා යන වියදම්
- රෝගය සඳහා වන ප්‍රතිකාරවලට අමතර සිදුකරන වියදම්. උදා- දුරකථන බිල්පත් , ආහාර , සේවා ගාස්තු යනාදිය
- නීති විරෝධී ක්‍රියාවල නිරත වීමකින් ඇතිවන අනතුරු/ රෝග හෝ ආබාධ
- හදිසි අනතුරක දී හැර අනෙක් අවස්ථාවල දී සිදු කරන ප්ලාස්ටික් සැත්කම් /රූපලාවණ්‍ය ප්‍රතිකාර/ තරබාරුව නැති කිරීමට ගන්නා ප්‍රතිකාර ආදි පෙනුම වර්ධනය සඳහා ලබා ගන්නා ප්‍රතිකාර
- ගැබ් ගැනීම් හා දරු ප්‍රසූතිය
- හෝමියෝපති ප්‍රතිකාර
- ශරීර අවයව ලබා දීම සඳහා රෝහල් ගත වීම ( hospitaization for donation of an organ)
- සිය කැමැත්තෙන් සිදු කර ගනු ලබන අනතුරු/ආබාධ. උදා: සියදිවි නසා ගැනීම
- මද්‍යසාර භාවිත කර ඇති අවස්ථා හෝ වෛද්‍යවරයකු විසින් සහතික නො කරන ලද හෝ උපදෙස් ලබා දී නොමැති ප්‍රතිකාර සඳහා
- වෛද්‍ය අනුමැතියකින් තොරව වන රෝහල්ගතවීම් හා රෝහල් ගතවීමට අදාළ නොවන රෝග සඳහා වන වියදම්
- යුද්ධයක දී, විදේශ ආක්‍රමණ, දෙපාර්ශ්ව අතර ඇති වන ගැටුම් යනා දි අවස්ථාවල දී සිදු වන අනතුරු/ආබාධ
- කලහකාරි ලෙස හැසිරීම්, උද්ඝෝෂණවල නිරතවීම් අවස්ථාවල දී සිදු වන අනතුරු
- අවසරයකින් තොරව සිදු කරන ගුවන් ක්‍රියා අත්හදා බැලීම්වල දී සිදුවන අනතුරු/ආබාධ

## 3.3 ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

රෝහලකින් පිටවූ පසු පහත ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය. රෝගියාගේ අවශ්‍යතා සඳහා ඡායා පිටපත් ලබා ගත යුතු ය. පහත සඳහන් ලිපිලේඛන **ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑ ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් ශාඛා කාර්යාලයකට** භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් ශාඛා ලේඛනය ඇමුණුම 06 හි දැක්වේ. හිමිකම් පත්‍රය ඇමුණුම 01 හි දැක්වේ.

| **ප්‍රතිලාභ අවස්ථාව හා ඉදිරිපත් කළ යුතු ලියවිලි** | |
|---|---|
| • ගෙවීම් කළ බිල්පත් වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර අනෙකුත් ඕනෑම ලේඛනයක පිටපතක් ඉදිරිපත් කිරීමේ දී එම ලේඛන විදුහල්පති විසින් හෝ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඕනෑම ශාඛාවක කළමනාකරුවෙකු, පරිපාලන නිලධාරියකු සහතික කර ඉදිරිපත් කළ යුතු ය.<br>• අඩු ආදායම්ලාභීන්ට පමණක් හිමි ප්‍රතිලාභ ලබා ගැනීමේ දී ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද අඩු ආදායම්ලාභීන් බව සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතු ය.<br>• මව /පියා වෙනුවට නීත්‍යානුකූල භාරකරුවකු ඉදිරිපත් වන විට නීත්‍යානුකූල භාරකාරත්වය පවරන ලද අදාළ ලියවිලි තිබිය යුතු ය.<br>• ප්‍රතිලාභ ලබා ගැනීමේදී අදාළ බිල්පත/මරණය සිදු වූ දින සිට දින 90 ක් තුළ හිමිකම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද රක්ෂණාවරණය අවසන් වන 2022.12.01 දින සිට දින 60 ක් ඇතුළත සියලු රක්ෂණ හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කර අවසන් කළ යුතු ය. ඒ අනුව රක්ෂණ හිමිකම්පත් භාර ගන්නා අවසාන දිනය 2023.01.30 දින වේ. | |
| රජයේ රෝහල් ගතවීමක දී | හිමිකම් පත්‍රය , ඇඳ ඉහ පත්‍රිකාව/රෝග නිශ්චය පත්‍රිකාව, සායන පත, බාහිරෙන් ලබා ගන්නා ඖෂධ හා පරීක්ෂණ සඳහා වෛද්‍යවරයා විසින් අනුමත කළ වට්ටෝරුව (නිල මුද්‍රාව සහිතව) එයට අදාළ ගෙවීම් කළ බිල්පත්වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර |
| පෞද්ගලික රෝහල් ගතවීමක දී බිල්පත් ප්‍රතිපූරණය කිරීම පමණි. | හිමිකම් පත්‍රය , රෝග විනිශ්චය පත්‍රිකාව, ගෙවීම් කළ කුවිතාන්සි (අවසන් හා අත්තිකාරම්), විස්තරාත්මක බිල්පත්වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර |
| බාහිර ප්‍රතිකාර( මුල් පිටපත්) | හිමිකම් පත්‍රය, වෛද්‍යවරයාගේ නිල මුද්‍රාව, දිනය, ලිපිනය, දුරකථන අංකය සහිත වට්ටෝරුව, විස්තරාත්මක බිල්පත, ගෙවීම් කළ ලදුපත් වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර |
| දෙමාපිය මරණයක දී | හිමිකම් පත්‍රය , මරණ සහතිකය, මරණ පරීක්ෂණ වාර්තාව (අවශ්‍ය අවස්ථාවල දී), තාවකාලික මරණ සහතිකය, ශිෂ්‍යාගේ උප්පැන්න සහතිකයේ පිටපත, සිසුවාගේ බැංකු ගිණුම් විස්තර, මියගිය තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, අඩු ආදායම්ලාභියෙකු බවට ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකය |
| පූර්ණ/ අර්ධ/ තාවකාලික අකර්මණ්‍යතාවක දී | හිමිකම් පත්‍රය, රෝග විනිශ්චය කාඩ්පත, වෛද්‍ය සහතිකය හා නිර්දේශ, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර |

| | |
|---|---|
| අසාධ්‍ය රෝග ප්‍රතිලාභ ලැබීමක දී | |
| -ඍජු ගෙවීමක දී | හිමිකම්පත්‍රය, විශේෂඥ වෛද්‍ය නිර්දේශ ලිපිය හා වැය ඇස්තමේන්තුව, රෝගයට අදාළ අනෙකුත් වෛද්‍ය සහතික,දෙමාපිය/භාරකරුගේ ඉල්ලීම් ලිපිය, ශිෂ්‍යයාගේ උප්පැන්න සහතිකයේ පිටපත, |
| -ප්‍රතිපූරණයක දී | හිමිකම්පත්‍රය, රෝග විනිශ්චය පත්‍රිකාව, ගෙවීම් කළ කුවිතාන්සි (අවසන් හා අත්තිකාරම්), විස්තරාත්මක බිල්පත්වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර, අනෙකුත් අවශ්‍ය ලියවිලි, ශිෂ්‍යයාගේ උප්පැන්න සහතිකයේ පිටපත |

## 3.4 බිල්පත් පියවීම

3.4.1 **ඍජු ගෙවීම් පහසුකම්**- අසාධ්‍ය රෝග සඳහා සහ අඩු ආදායම්ලාභීන් සඳහා පමණක්,

- අක්ෂි,කර්ණ, ශ්‍රවණ ආබාධ සඳහා ප්‍රතිකාර
- අක්ෂි, කර්ණ හා ශ්‍රවණ ආබාධ සඳහා නිවැරදි කිරීමේ උපකරණ ලබා ගැනීම

### 3.4.2 බිල්පත් ප්‍රතිපූරණය කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන ශාඛාවට හෝ ඕනෑම ශාඛා කාර්යාලයකට හිමිකම් පත්‍රය (ඇමුණුම 01) අවශ්‍ය ලිපි ලේඛන සමග ඉදිරිපත් කල විට කඩිනමින් ගෙවීම් කටයුතු සිදු කෙරේ.

## 3.5 ලියකියවිලි භාර දීම

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඕනෑම ශාඛා කාර්යාලයකට භාර දීම.
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට භාරදීම හෝ පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යැවීම.

> කළමනාකරු,
>
> 'සුරක්ෂා' රක්ෂණාවරණය,
>
> 13 වන මහල,
>
> ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
>
> රක්ෂණ මන්දිරය, නො 21, වොක්ෂෝල් වීදිය,කොළඹ 02

## 4 වන පරිච්ඡේදය - විවිධ අධ්‍යාපන ආයතනවලින් අපේක්ෂිත කාර්යභාරය

### 4.1. අධ්‍යාපන අමාත්‍යාංශය

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් ගේ ප්‍රධානත්වයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කිරීම සහ එය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වීම.

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා අදාළ අනෙකුත් ආයතන සමඟ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව මගින් සම්බන්ධීකරණය සිදුවේ.

- මෙම කාර්යය සම්බන්ධයෙන් හදිසි ඇමතුම් අංකය ස්ථාපිත කිරීම, හදිසි ඇමතුම් අංකය ලෙස 011 278 7979 භාවිත වන අතර ගැටලු සහගත අවස්ථාවල දී හා තොරතුරු ලබා ගැනීම සඳහා පෙරවරු 8.30 සිට පස්වරු 4.15 කාලය ඇතුළත ඇමතීමෙන් තොරතුරු ලබා ගත හැකි ය.
- පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, කලාප අධ්‍යාපන කාර්යාලවල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල වැඩසටහන භාර නිලධාරීන් දැනුවත් කිරීම
- පාසල්වල සිසු තොරතුරු රක්ෂණ ආයතනයට ලබා දීම හා තොරතුරු යාවත්කාලීන කිරීම.
- රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් පැන නගින ගැටලුවල දී මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.

## 4.2. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

- පළාත් අධ්‍යාපන ලේකම් ගේ සභාපතිත්වයෙන් කමිටුවක් ස්ථාපිත කිරීම, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, පළාත් සෞඛ්‍ය ලේකම් සහ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ, තම පළාතට අයත් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ආවරණය වන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියෝජිතයින් එහි සාමාජිකයින් වීම
- පාසල් වාරයකට වරක් රැස්වීම් පැවැත්වීම හා වාර්තා ගොනුවක් නඩත්තු කිරීම.
- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩසටහන භාර නිලධාරියකු පත් කිරීම.
- පළාතේ පවතින සියලු පාසල් සම්බන්ධයෙන් සිසු තොරතුරු නිසි පරිදි අදාළ අංශ වෙත ලබා දීම පිළිබඳ සොයා බැලීම.
- පාසල් ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීමේ කාර්යය ඉටු කිරීම.
- පළාතට අයත් සිසුවකුට රක්ෂණාවරණ ලබා ගැනීම සම්බන්ධයෙන් ඇති වන ගැටලු අවස්ථාවල දී මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.
- රක්ෂණ ආයතන සහ පළාතේ පවතින ශාඛා සමග සම්බන්ධතා පවත්වා ගැනීම
- සිසුන්ගේ රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීම හා එම හිමිකම් ලැබීම පිළිබඳ තොරතුරු කලාප කාර්යාල මඟින් ලබා ගෙන තොරතුරු ගොනුවක් පවත්වාගෙන යාම. එම තොරතුරු සය මාසික වාර්තාවක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අවස්ථා දෙකකදී ලබා දීම. (ඇමුණුම 03) (මෘදු හා දෘඪ පිටපත් වශයෙන්)
  - 2021.12.02-2022.05.31 දක්වා තොරතුරු 2022.12.15 ට පෙර
  - 2022.06.01-2022.12.01 දක්වා තොරතුරු 2023.03.31 ට පෙර

## 4.3. කලාප අධ්‍යාපන කාර්යාලය

- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් ස්ථාපිත කිරීම, කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන කලාපයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල වෛද්‍ය නිලධාරීන් ඇතුළු කණ්ඩායමක් එහි සාමාජිකයින් ලෙස පත් කර ගැනීම.
- පාසල් වාරයකට වරක් රැස්වීම් පැවැත්වීම හා වාර්තා ගොනුවක් නඩත්තු කිරීම.
- සෑම අධ්‍යාපන කලාපයක ම සිසු රක්ෂණ වැඩසටහන භාර නිලධාරියකු පත් කිරීම.
- අධ්‍යාපන කලාපයට අයත් පාසල් තොරතුරු නිසි වේලාවට ලබා දීම පිළිබඳ සහ නව තොරතුරු යාවත්කාලීන කිරීම පිළිබඳ කටයුතු කිරීම.
- අධ්‍යාපන කලාපයට අයත් පාසල් ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීමේ කාර්යය ඉටු කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ අධ්‍යාපන කලාපය තුළ හෝ ආසන්නයේ පවතින ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් ශාඛා සමග සම්බන්ධතා පවත්වා ගැනීම.

- රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් පැන නගින ගැටලුවල දී තම කලාපයේ පිහිටි, රක්ෂණ ආයතනයේ ශාඛාවක නියෝජිතයකු සම්බන්ධකර ගනිමින් ගැටලු නිරාකරණය කර දීමට මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.
- සිසුන්ගේ රක්ෂණ හිමිකම් ඉල්ලුම් කිරීම හා එම හිමිකම් ලැබීම පිළිබඳ තොරතුරු පාසල් මඟින් ලබා ගෙන තොරතුරු ගොනුවක් පවත්වාගෙන යාම. එම තොරතුරු අර්ධ වාර්ෂික වාර්තාවක් ලෙස පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත අවස්ථා දෙකකදී ලබා දීම. (ඇමුණුම 04) (මෘදු හා දෘඪ පිටපත් වශයෙන්)
    - 2021.12.02-2022.05.31 දක්වා තොරතුරු 2022.11.30 ට පෙර
    - 2022.06.01-2022.12.01 දක්වා තොරතුරු 2023.03.15 ට පෙර

## 4.4. පිරිවෙන/පාසල

- පරිවේනාධිපති/විදුහල්පති ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම, ගුරුභවතුන්, පාසල් සංවර්ධන සමිතියේ නියෝජිතයින් ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයින්, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නියෝජිතයින්ගෙන් සමන්විත වන පරිදි පාසලේ අවශ්‍යතාව මත සාමාජිකයින් සංඛ්‍යාව තීරණය කර ස්ථාපිත කිරීම.
- පාසල් වාරයකට වරක් රැස්වීම් පැවැත්වීම හා වාර්තා ගොනුවක් නඩත්තු කිරීම
- රක්ෂණ වැඩසටහනභාර වගකීම නියෝජ්‍ය විදුහල්පතිවරයකුට හෝ සහකාර විදුහල්පති වරයකුට ලිඛිතව පැවරීම, එවැනි තනතුරක් සහිත පුද්ගලයන් නොමැති විට ගුරුභවතකුට පැවරීම.
- පාසලට සිසුවෙකු අලුතින් ඇතුළත් වීමේ දී හෝ පාසලෙන් සිසුවෙකු ඉවත් වීමේ දී එම තොරතුරු නොපමාව අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත කළමනාකරණ අංශය වෙත ලබා දීම.
- රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම පිළිබඳ සිසුන්, දෙමාපියන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම.
- තම පාසලට ආසන්නයේ ඇති රක්ෂණ ආයතනයේ ශාඛා සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම සහ එම ශාඛා සම්බන්ධ අවශ්‍ය තොරතුරු ගොනුවක් පවත්වා ගැනීම.
- රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් සිසුන්ට ගැටලු සහගත වන අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් මැදිහත්කරුවකු ලෙස පෙනී සිටීම.
- රක්ෂණ අයදුම්පත්‍ර නිසි පරිදි සහතික කර නොපමාව අදාළ රක්ෂණ ආයතනය වෙත ඉදිරිපත් කිරීම සඳහා දෙමාපිය / භාරකරු වෙත ලබා දීම.
- තම පාසලේ රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධ තොරතුරු ඇතුළත් ගොනුවක් පවත්වා ගැනීම. (ඇමුණුම 02) එම තොරතුරු අර්ධ වාර්ෂික වාර්තාවක් ලෙස කලාප කාර්යාල වෙත අවස්ථා දෙකක දී ලබා දීම. (මෘදු හා දෘඪ පිටපත් වශයෙන්)
    - 2021.12.02 සිට 2022.05.31 දක්වා 2022.11.15 ට පෙර හා
    - 2022.06.01 සිට 2022.12.01 දින දක්වා 2023.02.15 ට පෙර

# 5 වන පරිච්ඡේදය - නියාමනය හා අධීක්ෂණය

නියාමනයේ දී අපේක්ෂිත කාර්යභාරය, නියාමනය සහ අධීක්ෂණයට අදාළ ව විවිධ ආයතන ක්‍රියා කළ යුතු ආකාරය, විශේෂ අවධානයට යොමු විය යුතු කරුණු, තොරතුරු ලබා ගැනීම යන විස්තර මෙම පරිච්ඡේදය තුළ අන්තර්ගත වේ.

## 5.1 නියාමනයේ දී අපේක්ෂිත කාර්යභාරය

- නිසි පරිදි සිසු තොරතුරු සැපයීම
- පාසලෙන් ඉවත් වන සිසු තොරතුරු නිසි වේලාවට යාවත්කාලීන කිරීම
- ප්‍රතිලාභ ලබා ගැනීම් පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම
- නියමිත පරිදි කමිටු රැස්වීම් පැවැත්වීම

- රක්ෂණාවරණය ලබා ගැනීමට සහාය වීම හා මඟ පෙන්වීම

## 5.2 ආයතන ක්‍රියා කළ යුතු ආකාරය

### 5.2.1 ජාතික මට්ටම

වැඩසටහන නියාමනය හා අධීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් ද සිදු කෙරේ. කිසියම් වරදක් හඳුනා ගත හොත් හෝ වංචාවක් සිදුවන බව අනාවරණය වුවහොත් ඒ පිළිබඳ ක්‍රියා කිරීමේ බලය මෙම ආයතන සතු වේ .

### 5.2.2 පළාත් මට්ටම

පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා ඔවුන් විසින් බලය පවරන ලද නිලධාරීන් මඟින් සිදු කෙරේ.

### 5.2.3 කලාප මට්ටම

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා ඔහු විසින් බලය පවරන ලද නිලධාරීන්, කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මඟින් රක්ෂණාවරණය ලබා ගැනීමට අදාළ සිද්ධි නියාමනය කෙරේ.

### 5.2.4 පාසල් මට්ටම

විදුහල්පති හා විදුහල්පති විසින් බලය පවරන ගුරුභවතුන්/නිලධාරීන් මඟින් රක්ෂණාවරණ ලබා ගැනීම හා ඒ සම්බන්ධ කටයුතු නියාමනය කෙරේ.

## 5.3 විශේෂ අවධානයට යොමු විය යුතු කරුණු

- ගෙවීමක් සිදු කිරීමට පෙර අමතර ලියවිලි ඉල්ලා සිටීමට හෝ අදාළ හිමිකමේ හෝ ඉදිරිපත් කළ ලියවිලිවල නිරවද්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය විමර්ශන කටයුතු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වේ.
- ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන්නේ වියදමට අදාළ ලියවිලිවල මුල් පිටපත් හෝ ඉල්ලා ඇති ආකාරයට ලියවිලි ඉදිරිපත් කළවිට පමණි.
- සාවද්‍ය හිමිකම් ඉල්ලීම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමට හේතු වන අතර තව දුරටත් ආවරණය අහෝසි කිරීමට හෝ වෙනත් සුදුසු දඬුවමකට යටත් වීමට හේතුවක් ලෙස සැලකේ.
- සියලු හිමිකම් බිල්පත්/මරණ ලියවිලි අදාළ දිනයේ සිට මාස 03ක් (දින 90) තුළ ඉදිරිපත් කළ යුතු අතර, 2022.12.01න් පසු රක්ෂණාවරණය අවසන් වී දින 60 ක් ඉකුත් වූ එනම්, 2023.01.30 න් පසු ඉදිරිපත් කරන බිල්පත් ගෙවීම් සඳහා සලකා බලනු නොලැබේ.
- ගිවිසුම්ගත කාල සීමාව ආරම්භ වූ 2021.12.02 දින සිට සිදු වූ සිද්ධි සම්බන්ධව බිල්පත් දිනය /මරණය සිදුවූ දිනයේ සිට දින 90ක් තුළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වූ අයදුම්කරුවන් සඳහා 2022.11.11 දින දක්වා අයදුම්පත් ඉදිරිපත් කිරීමට විශේෂ අවස්ථාවක් ලබා දී ඇත.
- දිගු කාලීන ප්‍රතිකාරවල දී හැර බෙහෙත් වට්ටෝරුව නිකුත් කළ දින සිට දින 07ක් ඇතුළත ඖෂධ/පරීක්ෂණ ලබා ගත යුතු ය.
- සියලු ප්‍රතිකාර MBBS හෝ DAMS හෝ ඊට සමාන හා වැඩි සුදුසුකම් සහිත වෛද්‍යවරුන් ගෙන් ලබා ගත යුතු ය.
- ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කරන අවස්ථාවල නැවත ඒවා ලබා ගත යුතු නම් අදාළ මුල් පිටපත අනුව ඡායා පිටපතක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශාඛාවකින් සහතික කරවා ගෙන මුල් පිටපත නැවත ලබා ගත හැකි ය. එසේ වුවද බිල්පත්/ ලදුපත් මුල් පිටපත් නැවත ලබා ගත නොහැකි ය.

## 5.4 තොරතුරු ලබා ගැනීම

- වැඩි විස්තර පහත වෙබ් අඩවිය මගින් ලබා ගත හැකි ය.
  - www.srilankainsuarane.com
  - www.moe.gov.lk
- දුරකථන අංක -
  - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - 0112 - 357 357 (24 පැය ඇමතුම් සේවාව)
  - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - 0112 – 319015 ( සතියේ දිනවල කාර්යාල වේලාව තුළ පෙ.ව. 8.30 ප.ව.4.45)
  - අධ්‍යාපන අමාත්‍යාංශය - 0112 - 787 979 ( සතියේ දිනවල කාර්යාල වේලාව තුළ පෙ.ව. 8.30 ප.ව.4.45)

ඇමුණුම 01

Ministry of Education

සුරක්ෂා

சுரக்ஷா

Suraksha

SLIC
Sri Lanka Insurance
Corporation Ltd

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා அலுவலக உபயோகத்திற்கு மட்டும் **Office use** | |
|---|---|
| ශිෂ්‍ය රක්ෂණ අංකය<br>மாணவர் காப்புறுதி இலக்கம்<br>Student Insurance No | හිමිකම් අංකය<br>கோரல் இலக்கம்<br>Claim No - |

## විමසීම් සඳහා /for inquiries/ சுரக்ஷா காப்புறுதி தொடர்புகளுக்கு:

## 011 231 9015/ 011 231 9016/ 011 231 9017

## සුරක්ෂා හිමිකම් පත්‍රය சுரக்ஷா காப்புறுதி நஷ்ட ஈடு கோரல் விண்ணப்பம் Suraksha Claim Form

**සම්පූර්ණයෙන්ම පුරවන්න** தயவு செய்து முழுமையாக பூர்த்தி செய்க **Please complete in full**

ශිෂ්‍ය ඇතුලත්වීමේ අංකය
மாணவர் பதிவிலக்கம்
Student Admission No

පාසල් සංගණන අංකය
பாடசாலை கணக்கெடுப்பு இலக்கம்
School Census No

පාසලේ නම
பாடசாலையின் பெயர்
Name of School

පාසලේ දුරකථන අංකය
பாடசாலை தொலைபேசி இலக்கம்
School Contact Number

### ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ විස්තර மாணவரின் விபரம் Student Details

සම්පූර්ණ නම
முழுப் பெயர்
Name in full

උපන් දිනය
பிறந்த திகதி
Date of Birth
D D M M Y Y Y Y

ස්ත්‍රී/ පුරුෂ භාවය
பாலினம்
Gender

දිස්ත්‍රික්කය
மாவட்டம்
District

ස්ථිර ලිපිනය
நிரந்தர முகவரி
Permanent Address

### හිමිකම් පිළිබඳ විස්තරය காப்புறுதி நஷ்ட ஈடு கோரல் விபரங்கள் Claim Details

**වෛද්‍ය ප්‍රතිකාර සහ රෝහල් ගතවීම් හිමිකම්** மருத்துவ சிகிச்சை /வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டமை **hospitalisation claims**

රෝහලේ නම வைத்தியசாலையின் பெயர் Name of Hospital

දිස්ත්‍රික්කය மாவட்டம் District

ආබාධය / රෝගය நோய் Ailment / Disease

**අකර්මණ්‍යතා හිමිකම්** அங்கவீனத்திற்கான நஷ்ட ஈடு கோரல் **Disability claims**

අකර්මණ්‍යතාවයට හේතුව
அங்கவீனத்திற்கான காரணம்
Cause of disability

**මරණ හිමිකම්** இறப்புக்கான நஷ்ட ஈடு கோரல் **Death claims**

මියගිය අයගේ නම
இறந்தவரின் பெயர்
Name of the deceased

ශිෂ්‍යයා/ශිෂ්‍යාවට ඇති ඥාතීත්වය
இறந்தவருடனான உறவு முறை
Relationship to the deceased

මව
தாய்
Mother

පියා
தந்தை
Father

නීත්‍යානුකූල භාරකරු
பாதுகாவலர்
Guardian

මරණයට හේතුව
மரணத்திற்கான காரணம்
Cause of death

මරණය සිදුවූ දිනය
இறந்த திகதி
Date of Death

මියගිය අයගේ ජා.හැ. අංකය அங்கவீனத்திற்கான நஷ்ட ஈடு கோரல் NIC Number of the deceased
(පිටපතක් අමුණන්න/பிரதியை இணைக்கவும்/ Attach a copy)

වෛද්‍ය ප්‍රතිකාර,රෝහල් ගතවීම් හිමිකම් හා හදිසි අනතුරු අකර්මණ්‍යතා ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පහත ලියකියවිලි ලබාදෙන්න
தயவுசெய்து மருத்துவ /மருத்துவமனை அனுமதிக்கப்பட்டமை/அங்கவீனம் என்பவற்றிற்கான நஷ்ட ஈடு பெற பின்வரும் ஆவணங்களை சமர்ப்பிக்கவும்.

**Please submit following documents for medical, hospitalisation and accidental disability claims:**

නිල මුද්‍රාව ඇතුලත් වෛද්‍යවරයාගේ රෝග විනිශ්චය කාඩ්පතේ විදුහල්පතිතුමා විසින් සහතික කළ පිටපතක්
வைத்தியரின் முத்திரையுடன் கூடிய நோய் நிருணய அட்டையின் அதிபரினால் சான்றுப்படுத்தப்பட்ட பிரதி
Copy of Diagnosis Card with Doctor's seal certified by the principal ☐

ලබාගත් ප්‍රතිකාර ඇතුලත්වන විස්තරාත්මක බිල්පත්වල මුල් පිටපත්
பெற்ற சிகிச்சைகள் உள்ளடக்கிய விளக்கமான பற்றுச்சீட்டுகளின் மூலப் பிரதிகள்
Original detail bills ☐

ගෙවීම් කර ලබාගත් ලදුපත්වල මුල් පිටපත්
கட்டணம் செலுத்தப்பட்ட பற்றுச் சீட்டுக்களின் மூலப் பிரதிகள்
Original Payment receipts for all payments ☐

වෛද්‍යවරයාගේ නිලමුද්‍රාව සහිත ඖෂධ වට්ටෝරුවේ විදුහල්පතිතුමා විසින් සහතික කළ පිටපතක්
மருத்துவரின் முத்திரை உடனான மருந்துச் சீட்டின் அதிபரினால் சான்றுப்படுத்தப்பட்ட பிரதி.
Copy of prescription with Doctor's seal certified by the principal ☐

**මරණ හිමිකම් ලබාගැනීම සඳහා පහත ලියකියවිලි ලබාදෙන්න**
இறப்புக்கான நஷ்ட ஈடு கோரலாயின் பின்வரும் ஆவணங்களை சமர்ப்பிக்கவும்
**Please submit following document for death claims:**

විදුහල්පතිතුමා විසින් සහතික කරන ලද මරණ සහතිකයේ පිටපතක්
அதிபரினால் உறுதிப்படுத்தப்பட்ட மரண அத்தாட்சிப் பத்திரத்தின் பிரதி
Copy of the death certificate certified by the Principal (certified copy) ☐

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ උප්පැන්න සහතිකයේ විදුහල්පතිතුමා විසින් සහතික කළ පිටපතක්
மாணவரின் பிறப்பு அத்தாட்சிப்பத்திரத்தின் பிரதி(அதிபரினால் அத்தாட்சிப்படுத்தப்பட்டது)
Copy of the birth certificate of the child certified by the principal ☐

ආදායම් සහතික කරමින් ග්‍රාම නිලධාරී විසින් ලබාදෙන තොරතුරු තහවුරු කිරීමේ ෆෝරමය ( අමුණා ඇත)
குடும்ப வருமானம் விபரங்கள் தொடர்பாக கிராம சேவகர் மூலம் சான்றுபடுத்தப்பட்ட படிவம் ( இணைக்கப்பட்டுள்ளது )
Form of income confirmation certificate of Grama Niladhare ( Attached) ☐

* භාරකරුගේ මරණ හිමිකම් සඳහා භාරකාරිත්වය තහවුරු කිරීමට අදාල නීත්‍යානුකූල ලියවිලි ඉදිරිපත් කළ යුතුය.
பாதுகாவலரின் அல்லது பொறுப்பாளரின் மரண உரித்துக்கான பொறுப்பேற்றல் கருமங்களை உறுதிசெய்து கொள்வதற்கு, தேவையான சட்டபூர்வமான எழுத்து ஆவணங்களை சமர்ப்பித்தல் வேண்டும்.
In the event of a guardian death claim, legal document(s) to prove the guardianship is required.

---

* **ගෙවීම් කල යුතු අයගේ විස්තරය (අදාල එක් අයෙකු වෙනුවෙන් පමණක් සම්පූර්ණ කරන්න)**
**මරණ හිමිකම් සඳහා ශිෂ්‍යයා / ශිෂ්‍යාවගේ නමින් තිබුන කරන ලද ගිණුම් සඳහා පමණක් ගෙවීම් සිදුකෙරේ**

**Details of the payee (To be filled in respect of one person only)**
In the event of a death claim, payment will be made only for the student.

**பணத்தை பெறுபவரின் விபரம் (உரிய ஒருவர் மாத்திரம் பூர்த்தி செய்க)**
**மரண கோரலின் போது மாணவ/மாணவியின் பெயர் மற்றும் கணக்கு இலக்கத்துடன் கூடிய வங்கிப்புத்தகத்தின் பிரதி.**

**මව / පියා / භාරකරු / ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ විස්තර | தாய்/தந்தை/பாதுகாவலர் மாணவரின் விபரங்கள் | Details of Mother/Father / Guardian/Student**

මව / පියා / භාරකරු / ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ නම:
பெயர் - தாய்/தந்தை பாதுகாவலர்/மாணவரின்
Name of Father / Mother / Guardian/ Student: ____________________

* භාරකරුගේ විස්තර ඉදිරිපත් කිරීමේදී භාරකාරීත්වය තහවුරු කිරීමට අදාළ ලියවිලි ඉදිරිපත් කළ යුතුය
பாதுகாவலரின் அல்லது பொறுப்பாளரின் பொறுப்பேற்றல் கருமங்களை உறுதி செய்து கொள்வதற்கு தேவையான சட்டபூர்வமான ஆவணங்கள் சமர்ப்பிக்கப்பட வேண்டும்.
Documents to prove the guardianship.

ජාතික හැඳුනුම්පත් අංකය
தேசிய அடையாள அட்டை இலக்கம்
NIC Number

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

ස්ථාවර දුරකථන අංකය நிலையான தொலைபேசி இலக்கம் Land Line ____________________
ජංගම දුරකථන අංකය கையடக்கத் தொலைபேசி இலக்கம் Mobile ____________________
ඊමේල් மின்னஞ்சல் Email ____________________

මුදල් බැර කල යුතු බැංකු ගිණුම් අංකය
நிதியை வைப்பிலிட வேண்டிய வங்கிக் கணக்கு இலக்கம்
Bank Account Number to which funds should be credited

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |

බැංකුව வங்கி Bank ____________________ බැංකු ශාඛාව கிளை Branch ____________________

* බැංකු පාස් පොතේ ගිණුම් අංකය සහ නම සඳහන් පිටුවේ/බැංකු ගිණුම් ප්‍රකාශයේ පිටපතක් අමුණන්න
வங்கிக் கணக்கு புத்தகத்தில் பெயரையும் கணக்கு இலக்கத்தையும் கொண்ட பக்கத்தின்/வங்கி கணக்கு கூற்றின், பிரதியை இணைக்கவும்
Attach a copy of Bank Account Passbook/ Bank statement with name and account number

ඉහත සඳහන් කරන ලද විස්තර නිවැරදි බවටත් ඉහත හිමිකමට සම්බන්ධ සියලුම විස්තර නොසඟවා ඉදිරිපත් කර ඇති බවටත් මෙමගින් තහවුරු කර සිටිමි/සිටිමු. මගින් ලබා දී ඇති තොරතුරු සාවද්‍ය නම් අදාල හිමිකම/හිමිකම් බැහැර කිරීමේ අයිතිය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සංස්ථාව පිළිගනිමි/පිළිගනිමු.

என்னால்/ எங்களால் மேலே தரப்பட்டுள்ள விபரங்கள் அனைத்தையும் உண்மையானவை எனவும் இவ்விடயத்தோடு சம்பந்தப்பட்ட அனைத்து தகவல்களும் ஒழிவு மறைவற்ற பூரணமானவை எனவும் உறுதிப்படுத்துகின்றேன் / உறுதிப்படுத்துகின்றோம். என்னால் எங்களால் வழங்கப்படுள்ள தகவல்கள் எவையேனும் வஞ்சகத் தன்மையானவையாக இருக்குமாயின் நஷ்ட ஈடு வழங்கலை ரத்து செய்யும் உரிமை இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபனத்திற்கு உண்டு என்பதனை ஏற்றுக் கொண்டு கையொப்பம் இடுகின்றேன்/ இடுகின்றோம்.

I/We hereby declare that all above statements and facts are true and that We/I have not withheld from the corporation any material information connected with this claim. I/We agree that if any of the information provided by me/us is false and/or misleading, the corporation reserves the right to repudiate my/ our claim.

(1) ..............................................
මව/පියා/ භාරකරුගේ අත්සන
பெற்றோர் /பாதுகாவலர் கையொப்பம்
Signature of the Parent/ Guardian

(2) ..............................................
විදුහල්පතිගේ සහතිකය (නිල මුද්‍රාව සහ අත්සන)
அதிபரின் அத்தாட்சிப்படுத்தல் (உத்தியோக முத்திரையும் கையொப்பமும்)
Certificate by the Principal (With official seal & Signature)

..............................................
දිනය திகதி Date

Ministry of Education

සුරක්ෂා

சுரக்ஷா

Suraksha

SLIC
Sri Lanka Insurance
Like a father - Like a mother

# සුරක්ෂා හිමිකම් සඳහා තොරතුරු තහවුරු කිරීම (දෙමාපිය මරණ හිමිකමකදී)
# சுரக்ஷா காப்புறுதிக்கான தகவல் உறுதிப்படுத்தல் படிவம் ( பெற்றோர் மரண காப்புறுதி கோரிக்கையின் போது)
# Confirmation of Information for Suraksha Claims (for parent death claims)

පාසල් සංගණන අංකය : .............................
பாடசாலை கணக்கெடுப்பு இல
School Census No

ශිෂ්‍යය ඇතුළත්වීමේ අංකය : .....................
மாணவர் சேர்விலக்கம்
Student Admission No

ශිෂ්‍යයාගේ නම : ..........................................................................................................
மாணவரின் பெயர்
Student Name

පහත සඳහන් කරුණු ග්‍රාම නිලධාරිතුමා/තුමිය විසින් සම්පූර්ණ කර එවිය යුතුය .
மேலே பெயர் குறிப்பிடப்படுகின்ற மாணவர் தொடர்பாக கீழ்வரும் தகவல்கள் கிராம சேவகர் மூலமாக பூரணப்படுத்தப்பட்டு எமக்கு அனுப்பி அனுப்பி வைக்கப்பட வேண்டியவை
The following details should be filled by the Gramasewa Niladhari.

1.ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය : .........................................
கிராம உத்தியோகத்தர் பிரிவு
Name of the Grama Niladhari Division

2. මියගිය අයගේ සම්පූර්ණ නම:..........................................................................................................
